# හස්එබු කාසිවල දක්නට ලැබෙන සංකේත පිළිබඳ මූලාශ්‍රය භාවිතයෙන් අධ්‍යයනයක්

**මදුෂානි ආර්.ඩබ්ලිව්.සී**[1]

අතීත මානවයාට මුල් කාලයේදී එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා පරිපූර්ණ කර ගැනීම සඳහා මුදල් අත්‍යවශ්‍ය සාධකයක් වූයේ නැත. ඔවුන් තමාට අවශ්‍ය ආහාරපාන, ඇඳුම් ආදී මූලික අවශ්‍යතා තමා විසින්ම නිපදවා ගනු ලැබූ අතර භාණ්ඩ හුවමාරුව මත ද තමාට අවශ්‍ය දෑ සපුරා ගැනීමට හුරුපුරුදු විය. මෙසේ ආරම්භ වූ භාණ්ඩ හුවමාරු ක්‍රමය කල්යත්ම මුදල් හුවමාරු ක්‍රමයක් දක්වාම වර්ධනය විය. එසේ කාසි භාවිතය නිසා නාණක විද්‍යාව ආරම්භ විය. ලංකාවේ හස්එබු කාසි පිළිබඳ ඉතිහාසය ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසට අයත් අනුරාධපුර ගෙඩිගේ කැණීමෙන් හමුවූ පැරණි කාසි අච්චු මගින් සනාථ වේ. හස්එබු කාසි සුවණ්ණ, කහපණ යන නම්වලින් හැඳින්වූ බව විසුද්ධිමග්ගයේ සඳහන් වේ. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ හස්එබු කාසි වල දක්නට ලැබෙන සංකේත පිළිබඳ හඳුනා ගැනීමයි. මෙහිදී දත්ත රැස් කිරීම සඳහා මූලාශ්‍රයගත තොරතුරු සහ අන්තර්ජාලය උපයෝගී කර ගන්නා ලදී. මෙම කාසි ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ දී භාවිතා කර ඇති බව එස්.එස්. සින් මහතා සඳහන් කරන අතර උතුරු ඉන්දියාවෙන් හෝ වෙළඳ, දේශපාලන සබඳතා නිසා ඒවා ලංකාවට ලැබෙන්නට ඇතැයි විශ්වාස කරයි. තඹ, රිදී වැනි මාධ්‍ය මේවා නිර්මාණය කිරීම සඳහා උපයෝගී කරගෙන ඇත. ලංකාවේ අනුරාධපුර අවධියේ ද ඉන්දියාවේ ද භාවිතා වූ කාසි වර්ගයක් ලෙස හස්එබු කාසි පෙන්වා දිය හැක. මෙම කාසි පිළිබඳව අධ්‍යනයේ දී ඒවායේ දක්නට ලැබෙන සංකේතයන් ආගමික සංකේත, ස්වභාවධර්මයට අයත් නොයෙකුත් වස්තූන් වල සංකේත, විවිධ ශ්‍රේණි වලට අයත් සංකේත ආදී වශයෙන් විවිධ අංශ යටතේ යොදාගෙන ඇති බව පෙනේ. ඉන් කීපයක් ලෙස ඉර හද සංකේත, කඳු සංකේතය, ගොඩනැගිලි සංකේතය, වෘක්ෂ සංකේතය, ජලය නිරූපිත සංකේතය, ජාමිතික රටා සංකේතය, ත්‍රිශූල සංකේත, ස්වස්තික හා කතිර සංකේත පෙන්වා දිය හැකිය. මෙම සංකේත වලට පාදක වූ කරුණු දෙස සොයා බැලීමේදී ආදිකාලීන මිනිසාගේ ජීවිතය හා ජීවන පැවැත්ම කෙරෙහි බලපෑමක් ඇති කළ වස්තූන් කෙරෙහි ඔවුන් යම් පූජනීයත්වයකින් හා ගරුත්වයකින් කටයුතු කිරීම නිසා ඔවුන් නිතර ගැවසුණු ඒ පරිසරයේ සංකේත කාසි නිෂ්පාදනයේ දී උපයෝගී කරගන්නට ඇති බව නිගමනය කළ හැකිය. මෙම සංකේත පිළිබඳ නාණක විද්‍යාඥයින් නොයෙකුත් අදහස් දරා ඇත. ඒ අතර දුර්ගා ප්‍රසාද්, කෝෂම්බි, බෂාම් වැනි විද්වතුන් වැදගත් වේ. ඒ අනුව හස්එබු කාසිවල යොදාගෙන ඇති සංකේත දෙස අවධානය යොමු කිරීමේදී අතීත මිනිසා එම යුගවල පැවති දේශපාලන, සමාජ, ආර්ථික රටාවන් පිළිබඳ මනා අවබෝධයෙන් කටයුතු කර ඇති ආකාරයත් ඔවුන් කලාකාමී දක්ෂතාවයන්ගෙන් පිරිපුන් පිරිසක් වූ බවත් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** නාණක විද්‍යාව, හස්එබු කාසි, සංකේත

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
chathurikam658@gmail.com